# වෙළෙඳාම සහ සංචාරක කර්මාන්තය

## සමස්ත වෙළෙඳ තුලනය

1985 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම සතුටුදායක නොවීය. විගැහි වටිනාකම් අනුව අපනයන ඉපැයීම් සියයට 8 කින් පහත වැටුනු අතර, ආනයන වියදම් සියයට 5 කින් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ හිඟය තියුණු අන්දමින් ඉහළ නැඟුණි. 1984 දී අපනයන ඉපැයීම් සියයට 44 කින් ඉහළ නැඟීම සහ ආනයන වියදම් ඉතා සුළු වශයෙන් සියයට 0.6 කින් පමණක් වැඩිවීම හා සසඳන විට මෙය ඉතා ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් ලෙස හැඳින්වීමට පුළුවන.

1985 දී තේ සහ රබර් මිළ ගණන් විශාල වශයෙන් පහත වැටීම, අපනයන ඉපැයීම් පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. නැව්, ගුවන් යානා, ආරක්ෂක ආම්පන්න, පාරිභෝගික භාණ්ඩ, තිරිඟු ඇට සහ පොහොර ආනයනය සඳහා විශාල වියදමක් දැරීමට සිදුවීම ආනයන වියදම ඉහළ යාමට හේතු විය.

තාවකාලික රේගු සංඛ්‍යාවලට අනුව 1985 දී ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 49,069 (විගැහි දශ ලක්ෂ 1,776) ක් ද, අපනයන ආදායම රුපියල් දශ ලක්ෂ 35,035 (විගැහි දශ ලක්ෂ 1,268) ක් ද විය. මේ අනුව වර්ෂයේ වෙළෙඳ හිඟය රුපියල් දශ ලක්ෂ 14,034 (විගැහි දශ ලක්ෂ 508) ක් විය. මෙය ඉකුත් වර්ෂයේ වෙළෙඳ හිඟය වූ රුපියල් දශ ලක්ෂ 9,907 (විගැහි දශ ලක්ෂ 380) ට වඩා විගැහි වටිනාකම් අනුව සියයට 34 ක වැඩි වීමකි. වාර්තා කිරීම් සම්බන්ධව සිදුවන කාල පමාව සහ වෙනත් කරුණු සැලකිල්ලට ගෙන රේගු සංඛ්‍යා ගලපනු ලැබීමෙන් පසුව මුළු ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 52,917 (විගැහි දශ ලක්ෂ 1,915) ක් ද මුළු අපනයන ආදායම රුපියල් දශ ලක්ෂ 36,207 (විගැහි දශ ලක්ෂ 1,311) ක් ද විය. මේ අනුව මෙම වර්ෂයේ ගලපන ලද වෙළෙඳ හිඟය වූ රුපියල් දශ ලක්ෂ 16,710 (විගැහි දශ ලක්ෂ 605) ඉකුත් වර්ෂයේ වෙළෙඳ හිඟය වූ රුපියල් දශ ලක්ෂ 10,194 (විගැහි දශ ලක්ෂ 391) ට වඩා විගැහි වටිනාකම් අනුව සියයට 55 ක වැඩිවීමක් පෙන්නුම් කළේය.

**1.26 සංඛ්‍යා සටහන**

**වෙළෙඳ තුලනය 1983—1985**

වටිනාකම රුපියල් දශ ලක්ෂ (වරහන් තුළ විගැහි දශ ලක්ෂ)

| වර්ෂය | ආනයන(අ) | | අපනයන(ඇ) | | වෙළෙඳ තුලනය | |
|---|---|---|---|---|---|---|
| | රේගු | ගලපන ලද | රේගු | ගලපන ලද | රේගු | ගලපන ලද |
| 1983 | 42,021 (1,670) | 45,558 (1,811) | 25,183 (1,001) | 25,096 (998) | −16,838 (−669) | −20,461 (−813) |
| 1984 | 46,913 (1,799) | 47,541 (1,823) | 37,006 (1,419) | 37,347 (1,432) | − 9,907 (−380) | −10,194 (−391) |
| 1985(ආ) | 49,069 (1,776) | 52,917 (1,915) | 35,035 (1,268) | 36,207 (1,311) | −14,034 (−508) | −16,710 (−605) |

(අ) සන රන් හා කාසි ඇතුළත් නොවේ.
(ආ) තාවකාලිකයි.
(ඇ) ප්‍රති-අපනයන ඇතුළත් වේ.

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව සහ
වෙනත් ප්‍රධාන ආනයනකරුවෝ,
සීමාසහිත එයාර් ලංකා,
ලංකා නැව් සංස්ථාව.

ඉකුත් දෙවර්ෂයේදී සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගත් ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂය ආනයන සහ අපනයන මිළ ගණන්වල හටගත් අහිතකර තත්ත්වයන් හේතුකොට ගෙන 1985 දී පිරිහීමට පත්විය. අපනයන මිළ දර්ශකය අනුව ගණන් බලනු ලබන අපනයන මිළ ගණන් 1984 දී සියයට 31 කින් වැඩිවූ අතර, 1985 දී සියයට 14 කින් පහත වැටුණි. මීට ප්‍රතිවිරුද්ධ ලෙස 1984 දී සියයට 8 කින් ඉහළ ගිය ආනයන මිළ ගණන් 1985 දී සියයට 11 කින් වැඩි විය. මෙම සාපේක්ෂ මිල හැසිරීම්වල ප්‍රතිඵලයක් ලෙස 1984 දී සියයට 22 ක ප්‍රගතියක් පෙන්වූ ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂය 1985 දී සියයට 23 කින් පහත වැටුණි.

**1·27 සංඛ්‍යා සටහන**

**විදේශීය වෙළෙඳාම 1979 – 1985**

| වර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | දර්ශක අංක 1981 = 100 | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | පරිමාව | | මිළ | | |
| | අපනයන (නැ.වි.ස.) | ආනයන (පි.ර.ගැ.) | වෙළෙඳ තුලනය | සියළුම අපනයන | සියළුම ආනයන | සියළුම අපනයන | සියළුම ආනයන | වෙළෙඳ අනුපාතය |
| 1979 | 15,273 | 22,560 | – 7,287 | 86 | 85 | 87 | 76 | 116 |
| 1980 | 17,595 | 33,942 | – 16,347 | 90 | 107 | 95 | 90 | 106 |
| 1981 | 21,043 | 36,582 | – 15,539 | 100 | 100 | 100 | 100 | 100 |
| 1982 | 21,454 | 41,946 | – 20,492 | 105 | 98 | 98 | 107 | 92 |
| 1983 | 25,096 | 45,558 | – 20,461 | 104 | 108 | 126 | 110 | 114 |
| 1984 | 37,347 | 47,541 | – 10,194 | 120 | 109 | 165 | 119 | 139 |
| 1985(අ) | 36,207 | 52,917 | – 16,710 | 126 | 102 | 141 | 132 | 107 |

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලික.
1980 සිට ඉදිරියට ගලපන ලදී.

**අපනයන**

ගලපන ලද සංඛ්‍යාවලට අනුව 1985 වර්ෂයේ අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 36,207 (විගැහි දශ ලක්ෂ 1,311) ක් විය. 1984 වර්ෂයේ අපනයන ඉපැයීම් වූ රුපියල් දශ ලක්ෂ 37,347 (විගැහි දශ ලක්ෂ 1,432) සමග මෙය සැසඳිය හැකිය. රුපියල් අගය අනුව සියයට 3 කින් ද, විගැහි වටිනාකම අනුව සියයට 8 කින් ද අපනයන ඉපැයීම්හි පහත වැටීම, 1984 වර්ෂයේ පිළිවෙලින් සියයට 49 ක හා සියයට 43 ක වර්ධනයන් හා සසඳන විට ප්‍රතිවිරුද්ධ ලක්ෂණයකි. 1984 සිට 1985 දක්වා කෘෂිකාර්මික අපනයන ඉපැයීම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 22,575 (විගැහි දශ ලක්ෂ 866) සිට රුපියල් දශ ලක්ෂ 19,026 (විගැහි දශ ලක්ෂ 689) දක්වා පහත වැටීම, 1985 වර්ෂයේ අපනයන පහත වැටීමට ප්‍රධාන වශයෙන් ඉවහල් වූ සාධකය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු අපනයනවලින් කෘෂිකාර්මික අපනයනවල පංගුව 1984 සිට 1985 දක්වා පිළිවෙලින් සියයට 60 සිට සියයට 52 දක්වා පහත වැටුණි. 1984 දී රුපියල් දශ ලක්ෂ 923 (විගැහි දශ ලක්ෂ 35) ක් වූ ඛණිජමය අපනයන ඉපැයීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 1,177 (විගැහි දශ ලක්ෂ 43) දක්වා සියයට 27 (විගැහි වටිනාකම් අනුව සියයට 20) කින් වැඩි විය. මේ අතර කාර්මික අපනයන ඉපැයීම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 12,815 (විගැහි දශ ලක්ෂ 491) සිට රුපියල් දශ ලක්ෂ 13,980 (විගැහි දශ ලක්ෂ 506) දක්වා සියයට 9 (විගැහි වටිනාකම අනුව සියයට 3) කින් ඉහළ නැඟුණි. මුළු අපනයනවලින්

කාර්මික අපනයනවලට අයත් පංගුව 1984 සිට 1985 දක්වා පිළිවෙලින් සියයට 34 සිට සියයට 39 දක්වා ඉහළ නැඟුණි. කෘෂිකාර්මික අපනයනවල පහත වැටීම මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව විය.

1985 දී කෘෂිකාර්මික අපනයන සියයට 16 කින් පහත වැටුණි. මෙම වර්ෂය තුළදී පොල් නිෂ්පාදනය හැරුණු විට අන් සියළු කෘෂිකාර්මික අපනයන ඉපැයීම් පහත වැටුණි. තේ අපනයන ආදායම සියයට 24 (විගැහි වටිනාකම අනුව සියයට 28) කින් ද, රබර් අපනයන ආදායම සියයට 22 (විගැහි වටිනාකම අනුව සියයට 27) කින් ද, සුළු කෘෂිකාර්මික භෝග අපනයන ආදායම සියයට 2 (විගැහි වටිනාකම අනුව සියයට 7) කින් ද පහත වැටුණි. අපනයන මිළ ගණන් සහ අපනයන පරිමාවන් ද පහත වැටීම් අපනයන ඉපැයීම් මෙසේ පහත වැටීමට හේතු විය. කෙසේ වෙතත් පොල් අපනයන පරිමාව සියයට 186 කින් වැඩිවීම නිසා පොල් මිළ ගණන් පහත වැටී තිබියදීත් පොල් අපනයන ඉපැයීම් සියයට 46 (විගැහි වටිනාකම අනුව සියයට 38) කින් ඉහළ නැඟුණි.

කාර්මික අපනයන ඉපැයීම් 1984 දී විගැහි වටිනාකම් අනුව සියයට 40 කින් ඉහළ නැඟීම සමග සසඳන විට 1985 දී එය සියයට 3 ක පමණ සුළු වැඩි වීමක් විය. අපනයන ඇඟලුම් කර්මාන්තයේ ඉපැයීම් පහත වැටීම මෙයට විශාල වශයෙන් හේතු විය. විගැහි වටිනාකමට අනුව අනෙකුත් කාර්මික නිෂ්පාදන ඉපැයීම්වල සියයට 4 ක පමණ සුළු වැඩි වීමක් විය. කෙසේ වෙතත් ඛණිජ තෙල් නිෂ්පාදන අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 3,288 (විගැහි දශ ලක්ෂ 126) සිට රුපියල් දශ ලක්ෂ 3,876 (විගැහි දශ ලක්ෂ 140) දක්වා සියයට 18 (විගැහි වටිනාකම් අනුව සියයට 11) කින් වැඩි විය.

තේ නිෂ්පාදනයේ සුළු වැඩි වීමක් තිබියදීත්, අපනයන පරිමාව 1984 සිට 1985 දක්වා පිළිවෙලින් කිලෝග්‍රෑම් දශ ලක්ෂ 204 සිට කිලෝග්‍රෑම් දශ ලක්ෂ 198 දක්වා පහත වැටුණි. නැ. වි. ස. සාමාන්‍ය මිළ 1984 සිට 1985 දක්වා පිළිවෙලින් කිලෝග්‍රෑම් එකක් රුපියල් 77.20 (විගැහි 2.96) සිට රුපියල් 60.62 (විගැහි 2.19) දක්වා පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තේ අපනයන වටිනාකම සියයට 24 (විගැහි වටිනාකම අනුව සියයට 28) කින් පහත වැටුණි. අන්තර් ජාතික තේ මිළ ගණන් පහත වැටීමට අනුරූපව කොළඹ තේ වෙන්දේසි මිළ 1984 දී කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 62.79 සිට 1985 දී රුපියල් 39.01 දක්වා සියයට 38 කින් පහත වැටුණි. කොළඹ තේ වෙන්දේසියේදී අලෙවි කළ තේ ප්‍රමාණය 1984 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 204 සිට 1985 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 198 දක්වා අඩු විය. මේ අතර 1984 දී ලන්ඩන් තේ වෙන්දේසියේ ශ්‍රී ලංකා තේ කිලෝග්‍රෑම් එකක මිල පැන්ස 247.41 ක්ව තිබී 1985 දී පැන්ස 158.86 ක් දක්වා සියයට 36 කින් පහත වැටුණි. ලන්ඩන් වෙන්දේසියට ඉදිරිපත් කළ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 2.6 සිට කිලෝග්‍රෑම් දශ ලක්ෂ 2.8 දක්වා ඉහළ නැඟුණි.

නිෂ්පාදනය සුළු වශයෙන් වැඩි වුවද, 1984 සිට 1985 දක්වා රබර් අපනයනය පිළිවෙලින් කිලෝග්‍රෑම් දශ ලක්ෂ 126 සිට කිලෝග්‍රෑම් දශ ලක්ෂ 120 දක්වා අඩු විය. රබර් කිලෝග්‍රෑම් එකක් සඳහා නැ.වි.ස. මිළ 1984 සිට 1985 දක්වා රුපියල් 26.16 සිට රුපියල් 21.34 දක්වා සියයට 18 කින් පහත වැටුණි. අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 3,301 (විගැහි දශ ලක්ෂ 127) සිට රුපියල් දශ ලක්ෂ 2,566 (විගැහි දශ ලක්ෂ 93) දක්වා සියයට 22 (විගැහි වටිනාකම අනුව සියයට 27) කින් පහත වැටුණි.

1985 දී සියළුම පොල් නිෂ්පාදනවල අපනයන වටිනාකම සියයට 46 (විගැහි වටිනාකම් අනුව සියයට 38) කින් වැඩි විය. පසුගිය වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 2,118 (විගැහි දශ ලක්ෂ 81) හා සසඳන විට 1985 දී අපනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 3,093 (විගැහි දශ ලක්ෂ 112) ක් විය. පොල් මද නිෂ්පාදිත අපනයන වටිනාකම 1984 දී රුපියල් දශ ලක්ෂ 1,553

## 1 . 28 සංඛ්‍යා සටහන
## අපනයන සංයුතිය

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | මුළු අපනයනවල ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1983 | 1984 | 1985 (ඇ) | 1983 | 1984 | 1985 | 1983 | 1984 | 1985 |
| 1. කෘෂිකාර්මික අපනයන .. | 14,554 | 22,575 | 19,026 | 579 | 866 | 689 | 58·0 | 60·4 | 52·5 |
| 1·1 තේ .. | 8,295 | 15,764 | 12,003 | 330 | 605 | 434 | 33·1 | 42·2 | 33·2 |
| 1·2 රබර් .. | 2,852 | 3,301 | 2,566 | 114 | 127 | 93 | 11·4 | 8·8 | 7·1 |
| 1·3 පොල් .. | 1,921 | 2,118 | 3,093 | 76 | 81 | 112 | 7·6 | 5·7 | 8·5 |
| 1·3·1 පොල් මද නිෂ්පාදිත .. | 1,409 | 1,553 | 2,383 | 56 | 60 | 86 | 5·6 | 4·2 | 6·6 |
| 1·3·2 වෙනත් .. | 512 | 566 | 710 | 20 | 22 | 26 | 2·0 | 1·5 | 2·0 |
| 1·4 සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (අ) .. | 1,486 | 1,391 | 1,365 | 59 | 53 | 49 | 5·9 | 3·7 | 3·8 |
| 2. කාර්මික අපනයන (අ) (ආ) .. | 8,821 | 12,815 | 13,980 | 351 | 491 | 506 | 35·1 | 34·3 | 38·6 |
| 2·1 රෙදිපිළි හා ඇඟළුම් .. | 4,738 | 7,535 | 7,899 | 188 | 289 | 286 | 18·9 | 20·2 | 21·8 |
| 2·2 ඛනිජ තෙල් නිෂ්පාදිත .. | 2,682 | 3,288 | 3,877 | 107 | 126 | 140 | 10·7 | 8·8 | 10·7 |
| 2·3 වෙනත් .. | 1,401 | 1,993 | 2,204 | 56 | 76 | 80 | 5·6 | 5·3 | 6·1 |
| 3. ඛනිජමය අපනයන .. | 1,132 | 923 | 1,177 | 45 | 35 | 43 | 4·5 | 2·5 | 3·2 |
| 3·1 මැණික් (ඊ) .. | 940 | 706 | 874 | 37 | 27 | 32 | 3·7 | 1·9 | 2·4 |
| 3·2 වෙනත් .. | 192 | 217 | 303 | 8 | 8 | 11 | 0·8 | 0·6 | 0·8 |
| 4. වර්ග නොකළ අපනයන (ඇ) .. | 589 | 1,033(ඉ) | 2,024(ඉ) | 23 | 40 | 73 | 2·3 | 2·8 | 5·6 |
| මුළු අපනයන (ආ) .. | 25,096 | 37,347 | 36,207 | 998 | 1,432 | 1,311 | 100·0 | 100·0 | 100·0 |

(අ) තෝරාගත් අයිතමයන්
(ආ) ගලපන ලදී
(ඇ) ප්‍රති අපනයන ඇතුළත්ය.
(ඈ) තාවකාලික
(ඉ) ගුවන් යානාවක අපනයනය ද ඇතුළත් වේ.
(ඊ) දියමන්ති ඇතුළත්ය.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

පරිවර්තනතාවය :
1983 විගැහි 1 = රුපියල් 25.16
1984 විගැහි 1 = රුපියල් 26.08
1985 විගැහි 1 = රුපියල් 27.63

(විගැහි දශ ලක්ෂ 59) සිට 1985 දී රුපියල් දශ ලක්ෂ 2,383 (විගැහි දශ ලක්ෂ 86) දක්වා සියයට 53 (විගැහි වටිනාකම් අනුව සියයට 45) කින් වර්ධනය විය. පොල් අපනයන පරිමාව 1984 දී පොල් ගෙඩි දශ ලක්ෂ 327 සිට 1985 දී දශ ලක්ෂ 935 දක්වා තියුණු අන්දමින් වැඩිවීම පොල් මද නිෂ්පාදන ඉපැයීම් වැඩි වීමට හේතුවූ සාධකය විය. පොල් අතුරු නිෂ්පාදන අපනයන වටිනාකම 1984 දී රුපියල් දශ ලක්ෂ 566 (විගැහි දශ ලක්ෂ 22) සිට 1985 දී රුපියල් දශ ලක්ෂ 710 (විගැහි දශ ලක්ෂ 26) දක්වා සියයට 25 (විගැහි වටිනාකම් අනුව සියයට 18) කින් ඉහළ ගියේය.

වර්ෂය තුළ අපනයනය කරන ලද පොල් පරිමාව, 1972 වර්ෂයේ ගෙඩි දශ ලක්ෂ 1,248 ක් අපනයනය කළාට පසු වාර්තාවූ ඉහළම පරිමාවයි. කෙසේ වෙතත්, අපනයනය කරනු ලැබූ පොල් මද නිෂ්පාදන ගෙඩි ගණනින් මිණූ කල ගෙඩියක නැ. වි. ස. මිළ 1984 දී රුපියල් 4.75 සිට 1985 දී රුපියල් 2.54 දක්වා සියයට 46 කින් පහත වැටුණි.

1983 දී සහ 1984 දී පිළිවෙලින් සියයට 9 කින් සහ සියයට 10 කින් අඩුවුනු සුළු කෘෂිකාර්මික භෝග අපනයන ඉපැයීම් 1985 දී තවදුරටත් සියයට 7 කින් පහත වැටුණි. කරාබුනැටි, එළවළු, පුවක්, සකස් නොකළ දුම්කොළ, බුලත්, තෙල් ලබා ගන්නා ඇට වර්ග සහ පලතුරු ආදියෙහි අපනයන ඉපැයීම් අඩුවීම මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

1984 දී රුපියල් දශ ලක්ෂ 12,815 (විගැහි දශ ලක්ෂ 491) ක් වූ කාර්මික අපනයන වටිනාකම 1985 දී රුපියල් දශ ලක්ෂ 13,980 (විගැහි දශ ලක්ෂ 506) දක්වා වැඩි විය. රෙදිපිළි සහ ඇඟැළුම් අපනයන ඉපැයීම් වටිනාකම 1984 දී රුපියල් දශ ලක්ෂ 7,535 (විගැහි දශ ලක්ෂ 289) සිට 1985 දී රුපියල් දශ ලක්ෂ 7,899 (විගැහි දශ ලක්ෂ 286) දක්වා විගැහි වටිනාකම් අනුව සියයට 1 කින් පමණ අඩුවිය. මේ අතර අනෙකුත් කාර්මික නිෂ්පාදන අපනයන වටිනාකම 1984 දී රුපියල් දශ ලක්ෂ 1,993 (විගැහි දශ ලක්ෂ 76) සිට 1985 දී රුපියල් දශ ලක්ෂ 2,204 (විගැහි දශ ලක්ෂ 80) දක්වා සියයට 11 (විගැහි වටිනාකම අනුව සියයට 4) කින් වැඩිවිය. කෙසේ වෙතත්, 1984 සිට 1985 දක්වා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 3,288(විගැහි දශ ලක්ෂ 126) සිට රුපියල් දශ ලක්ෂ 3,876 (විගැහි දශ ලක්ෂ 140) දක්වා ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන සියයට 18 (විගැහි වටිනාකම් අනුව සියයට 11) කින් වැඩිවීම මගින් ඉහත කී අපනයන වර්ධනයෙහි වූ පසුබෑම සමනය විය.

වැදගත් අපනයන භාණ්ඩයක් බවට පත්වීමෙන් පසු අඛණ්ඩව වැඩිවී ගිය ඇඟැලුම් නිෂ්පාදන අපනයන වටිනාකම, මෙම වර්ෂයේදී ප්‍රථම වරට විගැහි වටිනාකම අනුව පහත වැටුණි. එහෙත්, 1984 දී සියයට 20 ක් වූ මුළු අපනයන ඉපැයීම්හි එයට අදාළ පංගුව 1985 දී සියයට 22 දක්වා වැඩිවිය. මහ කොළඹ ආර්ථික කොමිසමෙහි ව්‍යවසායකයින් විසින් අපනයනය කරන ලද ඇඟැළුම්වල වටිනාකම 1984 දී රුපියල් දශ ලක්ෂ 2,687 (විගැහි දශ ලක්ෂ 103) ක් ද, 1985 දී රුපියල් දශ ලක්ෂ 2,901 (විගැහි දශ ලක්ෂ 105) ක් ද ලෙස ඇස්තමේන්තු කර ඇත.

1985 දී සුළු කෘෂිකාර්මික අපනයන සහ මැණික් අපනයන තවදුරටත් පහත වැටුණු අතර, ඉකුත් වර්ෂය සමග සසඳන විට කාර්මික අපනයන පමණක් සුළු වැඩි වීමක් වාර්තා කර ඇත.

**ආනයන**

1984 වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 47,541 (විගැහි දශ ලක්ෂ 1,823) ක්වූ මුළු ආනයන වියදම (ගලපන ලද සංඛ්‍යා) 1985 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 52,917 (විගැහි දශ ලක්ෂ 1,915) ක් විය. මේ අනුව මුළු ආනයන වියදම රුපියල් අගය අනුව සියයට 11 කින් ද, විගැහි වටිනාකම අනුව සියයට 5 කින් ද වැඩි විය. පාරිභෝගික භාණ්ඩ, නැව්, ගුවන් යානා, ආරක්ෂක ආම්පන්න, තිරිඟු ඇට සහ පොහොර ආනයන අධිකවීම මුළු ආනයන වියදම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවිය.

UNIVERSITY OF MORATUWA LIBRARY

## 1 . 29 සංඛ්‍යා සටහන

### ආනයනයන්හි අවසන් උපයෝජනය අනුව කෙරෙන වර්ගීකරණය

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | මුළු ආනයනයන්ගේ ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1983 | 1984(අ) | 1985(ආ) | 1983 | 1984 | 1985 | 1983 | 1984 | 1985 |
| **1. පාරිභෝගික භාණ්ඩ** | **11,639** | **11,052** | **14,261** | **462.7** | **423.8** | **516.2** | **25.5** | **23.2** | **27.0** |
| 1.1 ආහාර සහ පාන වර්ග | 5,375 | 4,986 | 5,906 | 213.7 | 191.2 | 213.8 | 11.8 | 10.5 | 11.2 |
| 1.1.1 සහල් | 765 | 197 | 1,089 | 30.4 | 7.5 | 39.4 | 1.7 | 0.4 | 2.1 |
| 1.1.2 පිටි | 108 | 28 | 206 | 4.3 | 1.1 | 7.5 | 0.2 | 0.1 | 0.4 |
| 1.1.3 සීනි | 1,985 | 1,346 | 1,985 | 78.9 | 51.6 | 71.8 | 4.4 | 2.8 | 3.7 |
| 1.2 රෙදිපිළි හා ඇඟළුම් | 2,724 | 2,974 | 3,799 | 108.3 | 114.0 | 137.5 | 6.0 | 6.2 | 7.2 |
| 1.3 වෙනත් | 3,540 | 3,092 | 4,556 | 140.7 | 118.6 | 164.9 | 7.8 | 6.5 | 8.6 |
| **2. අන්තර් භාණ්ඩ** | **21,727** | **23,749** | **25,532** | **863.7** | **910.7** | **924.2** | **47.7** | **50.0** | **48.2** |
| 2.1 ඛනිජ තෙල් | 11,024 | 10,681 | 10,986 | 438.2 | 409.6 | 397.6 | 24.2 | 22.5 | 20.8 |
| 2.2 පොහොර | 625 | 1,103 | 1,579 | 24.8 | 42.3 | 57.2 | 1.4 | 2.3 | 3.0 |
| 2.3 රසායනික ද්‍රව්‍ය | 832 | 1,028 | 902 | 33.1 | 39.4 | 32.6 | 1.8 | 2.2 | 1.7 |
| 2.4 තිරිඟු | 2,340 | 2,471 | 2,765 | 93.0 | 94.8 | 100.1 | 5.1 | 5.2 | 5.2 |
| **3. ආයෝජන භාණ්ඩ** | **12,077** | **12,170** | **10,387** | **480.1** | **466.7** | **376.0** | **26.5** | **25.6** | **19.6** |
| 3.1 යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 5,261 | 5,335 | 4,769 | 209.1 | 204.6 | 172.6 | 11.6 | 11.2 | 9.0 |
| 3.2 ගමනා ගමන උපකරණ(ඇ) | 3,826 | 3,031 | 2,499 | 152.1 | 116.2 | 90.5 | 8.4 | 6.4 | 4.7 |
| 3.3 ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,177 | 727 | 899 | 46.8 | 27.9 | 32.5 | 2.6 | 1.5 | 1.7 |
| **4. වර්ග නොකරන ලද** | **115** | **570** | **2,737** | **4.6** | **21.8** | **99.0** | **0.3** | **1.2** | **5.2** |
| **මුළු ආනයන(ඇ)** | **45,558** | **47,541** | **52,917** | **1,811.1** | **1,823.0** | **1,915.4** | **100.0** | **100.0** | **100.0** |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) රේගු වාර්තාවල සටහන් නොවූ නැව් සහ ගුවන් යානාවල වටිනාකම් ඇතුළත් වේ.
(ඇ) ගලපන ලදී.

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත් ප්‍රධාන ආනයනකරුවෝ,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
සීමාසහිත එයාර් ලංකා,
ලංකා නැව් සංස්ථාව.

1985 දී ආනයන සංයුතිය සැළකිය යුතු ලෙස වෙනස් විය. පාරිභෝගික භාණ්ඩවල පංගුව සියයට 23 සිට සියයට 27 දක්වා වැඩිවූ අතර, ආයෝජන භාණ්ඩවල පංගුව සියයට 26 සිට සියයට 20 දක්වා අඩුවිය. අන්තර් භාණ්ඩවල පංගුව සියයට 50 සිට සියයට 48 දක්වා සුළු වශයෙන් වෙනස් විය. හාල්, සීනි, පිටි, රෙදිපිළි, මෝටර් රථ හා මෝටර් සයිකල් ආනයනය කිරීම සඳහා වූ විශාල වියදම, පරිභෝගික භාණ්ඩ ආනයන වැඩි වීමට බලපෑ සාධකය විය.

1985 දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 10,387 (විගැහි දශ ලක්ෂ 376) ක් විය. මෙය, විගැහි වටිනාකම අනුව ඉකුත් වර්ෂයට වඩා සියයට 19 ක අඩුවීමකි. නැව් සහ ගුවන් යානා ආනයන වටිනාකම අඩු කළවිට, ආයෝජන භාණ්ඩ ආනයන වටිනාකම තවදුරටත් අඩුවීමක් පෙන්නුම් කෙරේ. විගැහි අගය අනුව සැළකීමේ දී ආයෝජන භාණ්ඩ ආනයන වටිනාකම් අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉකුත් වර්ෂයට වඩා ප්‍රවාහණ උපකරණ (සියයට 22) සහ යන්ත්‍රෝපකරණ (සියයට16) ආනයනය කිරීම් අඩු වීමයි. කෙසේ වෙතත්, 1984 දී සියයට 40 කින් (විගැහි වටිනාකම අනුව) පහත වැටී තිබුණු ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය 1985 දී සියයට 16 කින් වැඩි විය.

1984 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 23,749 (විගැහි දශ ලක්ෂ 911) ක් වූ අන්තර් භාණ්ඩ ආනයන වියදම සමග සසඳන විට, 1985 දී එම වියදම රුපියල් දශ ලක්ෂ 25,532 (විගැහි දශ ලක්ෂ 924) ක් දක්වා සියයට 8 (විගැහි වටිනාකම් අනුව සියයට 2) කින් වැඩිවිය. කෙසේ වෙතත්, තිරිඟු ඇට ආනයන වියදම සියයට 12 (විගැහි වටිනාකම අනුව සියයට 6) කින්ද, පොහොර ආනයන වියදම සියයට 43 (විගැහි වටිනාකම් අනුව සියයට 35) කින් ද වැඩිවිය. ඉකුත් වර්ෂයේදී සියයට 24 (විගැහි වටිනාකම අනුව සියයට 19) කින් වැඩිවී තිබූ රසායනික ද්‍රව්‍ය ආනයනය, 1985 දී සියයට 12 (විගැහි වටිනාකම අනුව සියයට 17) කින් පහත වැටුණි. 1984 දී රුපියල් වටිනාකම අනුව සියයට 3 (විගැහි වටිනාකම අනුව සියයට 7) කින් අඩුවී තිබුණු ඛනිජ තෙල් ආනයන වියදම 1985 දී විගැහි වටිනාකම් අනුව තවදුරටත් සියයට 3 කින් පහත වැටුණි. කෙසේ වෙතත්, රුපියල් වටිනාකම අනුව සියයට 3 ක වැඩිවීමක් මෙහි දක්නට ලැබේ. මුළු අන්තර් භාණ්ඩ ආනයනයෙන් ඛනිජ තෙල් ආනයනයට අදාළ වූ පංගුව ඉකුත් වර්ෂයට වඩා සුළු වශයෙන් අඩු විය. අන්තර් ජාතික වෙළෙඳ පොළෙහි ඛනිජ තෙල් නිෂ්පාදිත මිළ ගණන් අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

**1.30 සංඛ්‍යා සටහන**

**1985–ප්‍රධාන ආනයනයන්හි පරිමාව**

මෙට්‍රික් ටොන්

| මාසය | සහල් | තිරිඟු | සීනි | ඛනිජ තෙල් (බොර තෙල්) | පොහොර |
|---|---|---|---|---|---|
| ජනවාරි .. | 45 | 68,964 | 25,600 | 29,816 | 20,970 |
| පෙබරවාරි .. | 23,946 | 85,764 | 31,463 | 31,823 | 20,260 |
| මාර්තු .. | 20,126 | 35,069 | 33,300 | 237,591 | 18,380 |
| අප්‍රේල් .. | 20,227 | 52,500 | 45,079 | 157,201 | 33,215 |
| මැයි .. | 18,344 | 52,500 | 36,000 | 170,648 | 28,339 |
| ජූනි .. | 6,860 | 52,500 | 16,420 | 124,424 | 32,387 |
| ජූලි .. | 27,265 | 68,330 | 18,500 | 154,748 | 40,677 |
| අගෝස්තු .. | 20,077 | 51,618 | 770 | 63,911 | 42,213 |
| සැප්තැම්බර් .. | 20,525 | 35,945 | 25,322 | 187,224 | 28,600 |
| ඔක්තෝබර් .. | 14,907 | 58,512 | 19,223 | 186,117 | 94,817 |
| නොවැම්බර් .. | 10,002 | — | 68,494 | 158,287 | 42,907 |
| දෙසැම්බර් .. | 29,044 | 103,444 | 67,448 | 155,679 | 31,100 |
| එකතුව (අ) (ආ) .. | 211,367 | 665,146 | 387,621 | 1,657,469 | 433,865 |

(අ) ගලපන ලද.
(ආ) පසුව කරන ලද ගැලපීම් හේතුවෙන් මාසික දත්තයන්ගේ එකතුව වාර්ෂික මුළු එකතුවට සමාන නොවිය හැකිය.

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව.

1984 දී සියයට 5 (විගැහි වට්නාකම අනුව සියයට 8 ) කින් අඩුවූ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 1985 දී සියයට 29 (විගැහි වට්නාකම අනුව සියයට 22) කින් පමණ තියුණු ලෙස වැඩිවිය. සියළුම පාරිභෝගික භාණ්ඩ කාණ්ඩවල, එනම් ආහාර සහ පාන වර්ග, රෙදි-පිළි හා ඇඟළුම් සහ අනෙකුත් පාරිභෝගික භාණ්ඩ යනාදියෙහි මෙම වැඩිවීම පිළිබිඹු විය. විගැහි වට්නාකම අනුව සළකන විට ඉකුත් වර්ෂයට වඩා මෙම වැඩිවීම් පිළිවෙලින් සියයට 12 ක්, සියයට 21 ක් සහ සියයට 39 ක් විය. ආහාර සහ පාන වර්ග ආනයන කාණ්ඩයට අයත් සහල් ආනයන වියදම, රුපියල් දශ ලක්ෂ 197 (විගැහි දශ ලක්ෂ 7.5) සිට රුපියල් දශ ලක්ෂ 1,089 (විගැහි දශ ලක්ෂ 39) දක්වා සිව් ගුණයකටත් අධික වැඩිවීමක් ද, සීනි ආනයන වියදම සියයට 48 (විගැහි වට්නාකම අනුව සියයට 39) ක වැඩිවීමක් ද වාර්තා කළේය. අනෙකුත් පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයට අයත් මෝටර් රථ සහ මෝටර් සයිකල් ආනයන වියදම කැපී පෙනෙන ලෙස වැඩිවූ අතර, ගුවන්විදුලි හා රූපවාහිනී යන්ත්‍ර විගැහි වට්නාකම අනුව සියයට 18 කින් වැඩිවිය.

## විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය

1977 දී ආරම්භ කෙරුණ නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනස්කම් ද සහිතව 1985 දීත් ක්‍රියාත්මක විය. රෙදිපිළි ආනයනය කිරීම සම්බන්ධයෙන් පැවති සීමා ඉවත් කිරීම විශේෂයෙන් සඳහන් කළ හැකිය. දේශීය වශයෙන් නිෂ්පාදනය වැඩිවී තිබූ ආහාර ද්‍රව්‍ය සඳහා ඇතැම් ආනයන පාලනය කිරීම් දිගටම පවත්වා ගෙන යන ලදි. තත්ත්ව පරීක්ෂාව සහතික කිරීම පිණිස ඇතැම් අපනයන ද්‍රව්‍ය සඳහා අපනයන බලපත්‍ර නියම කෙරුණු අතර, පහත වැටුණු අපනයන මිළ ගණන්වලින් අපහසු තත්ත්වයට පත්ව සිටි නිෂ්පාදකයන්හට සහනයක් සළසනු පිණිස තේ සහ පොල් සඳහා වූ අපනයන බදු ද ලිහිල් කරනු ලැබීය.

රෙදිපිළි ආනයනයේදී කපුරෙදි සඳහා මි. ර. ගැ. වට්නාකමින් සියයට සියයක තීරු බද්දක් හෝ මීටරයකට රුපියල් 25 ක් ද, කෘතිම රෙදි සඳහා මි. ර ගැ. වට්නාකමින් සියයට 100 ක් හෝ මීටරයකට රුපියල් 40 ක් ද පැණවීම සමගම රෙදිපිළි ආනයන සම්බන්ධව පැවති දැඩි සීමා කිරීම් ඉවත් කරන ලදි. දේශීය රෙදිපිළි කර්මාන්තය සුරක්ෂිත කිරීම, රෙදිපිළි ආනයන සම්බන්ධව පැවති සම්බාධකවල පරමාර්ථය වූ නමුත්, නීති විරෝධි ලෙස රෙදිපිළි ගෙන්වීම බහුලව සිදු වීමත්, ආනයනය කළ රෙදිපිළි අපනයන කර්මාන්තකරුවන් වෙතින් ලබාගත හැකි වීමත් නිසා මෙම පරමාර්ථය ප්‍රතිඵල විරහිත බවට පත්විය. රෙදිපිළි ආනයනය ලිහිල් කිරීම නිසා බලපත්‍ර අවශ්‍ය වූයේ භාණ්ඩ කිහිපයක් සඳහා පමණකි.

වියළි මිරිස්, අර්තාපල්, ලූණු, තක්කාලි, සුදුලූණු, කිරි ආහාර, සහල්, ලුණු දැමූ මාලු සහ කරවල ආදී ආහාර ද්‍රව්‍යවල දේශීය නිෂ්පාදනය අභ්‍යන්තර ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් වූ හෙයින් එවැනි ආහාර ද්‍රව්‍ය ආනයන පාලනය යටතේ පැවතිනි. මෙබඳු ආහාර ද්‍රව්‍යවල ආනයන සීමිත කිරීම් මගින් දේශීය වෙළෙඳපොළෙහි මිළ ගණන් පහත වැටීමට තරම් තුඩුදිය හැකි අතිරික්ත ආනයනයන් වළක්වාලීමට රජයට හැකි විය.

ආනයන සම්බන්ධව මෙන්ම අපනයනයේදීත් බොහෝ නිෂ්පාදන බලපත්‍ර යටතේ පැවතිනි. අපනයන භාණ්ඩවල අව්‍යාජත්වය සහතික කරනු පිණිස දුව සහ දුව නිෂ්පාදන, සම් හා සත්ව හම්, ඇත් දළ හා ඇත් දළ නිෂ්පාදිත, ඛණිජ හා ඛණිජ වැලි සහ යපස් ආදිය අපනයනය කිරීමේදී බලපත්‍ර ලබාගත යුතු විය. අදුරදර්ශී අපනයන ප්‍රතිපත්තිවලින් ස්වාභාවික සම්පත් විනාශ වීමට ඉඩ නොදී රැක ගැනීම ද මේ ප්‍රතිපත්තියෙහි තවත් අරමුණක් විය. මත්ස්‍ය නිෂ්පාදන, කුරුඳු, එළවලු, කජු ඇට ආදිය අපනයනයේදී මෙම ද්‍රව්‍යවල තත්ත්ව පාලනය සහතික කිරීම බලපත්‍ර නියම කිරීමෙහි අරමුණ විය. එමෙන්ම, තිරිඟු පිටි, සහල්, ඖෂධ, ඉවත දමන කඩදාසි, කඩදාසි බෝඩ්, සත්ව ආහාර, ලෝහ සහ ලෝහ සුන්බුන් ආදිය අපනයනය කිරීමේදී එමගින් දේශීය වෙළෙඳපොළෙහි හිඟයක් හෝ දේශීය කර්මාන්තවල ගැටළුවක් ඇති නොවීම සහතික කරනු පිණිස අදාල බලධාරීන්ගෙන් බලපත්‍ර ලබාගැනීම අවශ්‍ය විය.

වඩාත් නිවැරදි ඵලදායී ආරක්ෂණයක් සැපයීම සඳහා සකස් කළ 1984 විස්තීර්ණ තීරු බදු සංශෝධන මාලාව 1985 වර්ෂය පුරා ක්‍රියාත්මක විය. ජනාධිපති තීරු බදු කොමිසමේ නිර්දේශ පරිදි ඉදිරිපත් කළ මෙම සංශෝධනවල පරමාර්ථය වූයේ දේශීය සම්පත් මනා ලෙස පරිහරණයට යොදා ගැනීමයි.

බදු සහන, ආනයන බදු ප්‍රතිධාන, සහනදායී මූල්‍යමය සහ අපනයන ණය රක්ෂණය වැනි සානුබල ගණනාවක් සළසා තිබියදීත් සාම්ප්‍රදායික නොවන අපනයන අංශයෙහි දිරිගන්වන සුළු ක්‍රියාකාරීත්වයක් දක්නට නොලැබිණි. 1985 දී ඛනිජ තෙල් නිෂ්පාදන සහ ඇතැම් කාර්මික භාණ්ඩ කිහිපයක් ආශ්‍රිතව පමණක් අපනයන කටයුතු සතුටුදායක ලෙස පැවතුණි. සුළු කෘෂිකාර්මික නිෂ්පාදන, මැණික් සහ ඇතැම් කෘෂි මූලික කර්මාන්ත ආශ්‍රිත අපනයන අංශවල පරිහාණියක් දක්නට ලැබුණි. 1985 වර්ෂය අවසානයේදී ක්‍රියාත්මක වූ අඩු පොලී අනුපාත සහ යථාරූපී විනිමය අනුපාතය මෙම අංශයට පුනර්ජීවයක් ලබා දීමට උපකාරී විය. කෙසේ වෙතත් මෙම වෙනස්කම්වල ඵලදායිත්වය විනිශ්චය කළ හැක්කේ කාලපමාවකින් පසුවය.

අපනයන භාණ්ඩවල විශේෂයෙන් තේවල මිළ මට්ටම් තියුණු අන්දමින් පහත බැසීමෙන් හටගත් අහිතකර ප්‍රතිවිපාක සමනය කරනු පිණිස තීරු බදු සංශෝධනය කිරීම අවශ්‍ය විය. 1985 අප්‍රේල් මාසයේ පටන් තේ මිළ තියුණු ලෙස පහත වැටීම ඇරඹිණි. අපනයනකරුවන්ට සහනදායී පියවරක් වශයෙන්, සියළුම වර්ගවල තේ සඳහා තීරු බදු අඩු කරන ලදී. තේ කිලෝ ග්‍රෑමයක් සඳහා මෙතෙක් ක්‍රියාත්මක වූ රුපියල් 1.50 සිට රුපියල් 12.50 දක්වා වූ තීරු බදු අනුපාත, ශත 50 සිට රුපියල් 10.00 දක්වා අඩු කරන ලදී. තවදුරටත් අගයානුකූල බද්දේ ආරම්භය කිලෝ ග්‍රෑමයකට රුපියල් 32.00 සිට රුපියල් 40.00 දක්වා වැඩි කරනු ලැබූ අතර මිළ රුපියල් 40.00 ඉක්මවා යන ප්‍රමාණයෙන් සියයට 50 කට පමණක් එය සීමා කෙරිණි. මෙම සංශෝධනයත් සමග අගයානුකූල බදු ප්‍රතිදාන ක්‍රමය අහෝසි කරන ලදී. කපාපු පොල් සහ කොප්පරා මෙට්‍රික් ටොන් එකක් සඳහා අපනයන තීරු බද්ද රුපියල් 2,500 කින් අඩු කරන ලද අතර, සියයට 25 ක්වූ මිණිරන් අපනයන තීරු බද්ද සියයට 15 දක්වා අඩු කරන ලදී. තරඟකාරීත්වයට මුහුණ දීමට හැකිවනු පිණිස මිණිරන් අපනයන මිළ පහත හෙලීම මිණිරන් තීරු බදු සංශෝධනය මගින් බලාපොරොත්තු විය.

1985 දී, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භාණ්ඩ තුන සඳහා ස්ථායීකරණ අරමුදල් පිහිටුවන ලදී. මිළ ඉහළ නැඟුණු අවස්ථාවල ලැබෙන අතිරික්ත ආදායම එක්රැස් කොට මිළ පහත වැටුනු අවස්ථාවලදී නිෂ්පාදකයන්හට එමගින් මිළ සහනයක් ලබා දීම මෙම ස්ථායීකරණ අරමුදලේ පරමාර්ථය විය. ආර්ථිකයේ පාලනයට පරිබාහිර වූ සාධක නිසා ඇතිවන මෙවැනි තියුණු උච්චාවචනයන්ගේ බලපෑමවලින් රජයේ අය වැය ස්ථායීකරණය කිරීමට ද මෙම ස්ථායීකරණ අරමුදල් උපකාරී වීය.

1985 ඔක්තෝබර් මාසයේදී අවසන් වීමට නියමිත අන්තර් ජාතික ස්වාභාවික රබර් සම්මුතිය 1987 දක්වා තවත් අවුරුදු දෙකකින් දීර්ඝ කරන ලදී. මෙම සම්මුතියෙහි සාමාජිකත්වය හිමි අපනයන රටවල් හතට ශ්‍රී ලංකාව ද අයත් වෙයි.

**අභ්‍යන්තර වෙළෙඳාම**

1977 දී ආරම්භ වූ නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තියට අනුකූලව වෙළෙඳපොළ බලවේගවල නිදහස් ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තියේ පරමාර්ථය විය. ඒ නිසා, වෙළෙඳපොලෙහි යහපත් තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා එමගින් විවෘත වෙළෙඳපොළෙහි අත්‍යාවශ්‍ය භාණ්ඩ තරඟකාරී මිළකට පවත්වා ගැනීම පිණිසත්, රජයේ මැදිහත්වීම අවම මට්ටමකින් සිදුවිය. කෙසේ වෙතත් අසම්මත වෙළෙඳ කටයුතු වළක්වාලනු පිණිස යම් යම් ආයතනික රෙගුලාසි අඛණ්ඩව ක්‍රියාත්මක විය. පාරිභෝගික ආරක්ෂක පණත, මිළ පාලන පණත සහ කිරුම් හා මිනුම් ආඥා පනත යොදා ගනිමින් අභ්‍යන්තර වෙළෙඳ කටයුතු දෙපාර්තමේන්තුව විසින් මෙම රෙගුලාසි ක්‍රියාත්මක කරවන ලදී.

ඉකුත් වර්ෂයේදී මෙන්ම 'මහපොළ' සහ පාරිභෝගික සමිති මගින් පාරිභෝගික සහභාගිත්වය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු විය. 1985 වර්ෂය තුළදී මහපොළ 18 ක් ද, පාරිභෝගික සමිති 3,544 ක් ද පිහිටුවන ලදී.

පාරිභෝගික සහ නිෂ්පාදන යන දෙපාර්ශවයේම සුභසිද්ධිය පිණිස ජාතික මිළ කොමිසම විසින් මිළ පාලන කටයුතු මෙහෙයවන ලදී. ඉකුත් වර්ෂයේදී කරනු ලැබූ මිල විමර්ශනයන් 76 හා සසඳන විට විමර්ශණ වර්ෂයේදී කොමිසම මගින් මිළ විමර්ශනයන් 58 ක් සිදු කරන ලදී. ඒකාධිකාරීන්, ඒකාබද්ධ සමාගම් සහ ප්‍රතිතරඟකාරී ප්‍රතිපත්ති පාලනය කිරීම සඳහාත්, ජාතික මිළ ප්‍රතිපත්තියක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම සඳහාත් 'සාධාරණ වෙළෙඳ කොමිසම් සභාවක්' පිහිටුවීම සඳහා අවශ්‍ය නීති පද්ධතිය ද වර්ෂය තුළ පිළියෙල කරන ලදී.

රාජ්‍ය අංශයේ වෙළෙඳ සංවිධාන පෞද්ගලික අංශය සමඟ වඩාත් තරඟකාරී අන්දමින් පවත්වාගෙන යාම සඳහාත්, වාණිජමය ශක්‍යතාවය දියුණු කර ගැනීම සඳහාත් ස්වකීය වෙළෙඳ කටයුතු විස්තෘත කරන ලදී. කෙසේ වෙතත්, 1985 දී මෙම සංවිධානවලින් බොහොමයක් විසින් අඩු පිරිවැටුම් වාර්තා කර ඇත. කෙසේ වුවද, මීට ප්‍රතිවිරුද්ධ ලෙස සමූපකාර තොග වෙළඳ ආයතනය (ස. තො. ස.) ඉහළ පිරිවැටුමක් වාර්තා කරන ලදී. පාරිභෝගික මිළ ගණන් ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමත්, සම්භාරක තොග පවත්වා ගැනීම මගින් අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදා හැරීමත් මගින් වැදගත් කාර්ය භාරයක් ස. තො. ස. විසින් ඉටු කරන ලදී.

අභ්‍යන්තර වෙළෙඳ කටයුතු විෂයෙහි සමූපකාර සමිතිවල කාර්ය භාරය සහල්, පිටි, සීනි වැනි මූලික ආහාර ද්‍රව්‍ය සහ ආහාර මුද්දර ක්‍රමය යටතේ වූ අනෙකුත් පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීමේ කටයුතුවලට ප්‍රධාන වශයෙන් සීමා විය. කෙසේ වෙතත්, දිවයිනේ අභ්‍යන්තරික නොසන්සුන්තා හට ගැනීමත් සමඟ අත්‍යාවශ්‍ය භාණ්ඩ කාර්යක්ෂම අන්දමින් බෙදා හැරීම අත්‍යාවශ්‍ය කාර්යයක් බවට පත් වීම නිසා සමූපකාර සමිති රැක ගැනීමේ අවශ්‍යතාවය වඩාත් දැනෙන්නට විය.

**සංචාරක කර්මාන්තය**

1985 දී සංචාරක කර්මාන්තයේ ගමන් මාර්ගය තවදුරටත් පරිහානියට පත් විය. සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත් කරවීම සඳහා පියවර ගනු ලැබ තිබියදීත් සංචාරක පැමිණීම්, සංචාරක දින ගණන් (රාත්‍රී), කාමර උපයෝගීකරණය, විනිමය ඉපැයීම් වැනි ප්‍රධානතම දර්ශකයන්හි අඩුවීමක් දක්නට ලැබුණි. ප්‍රධාන සංචාරක වෙළඳපොලවල් තුළ ශ්‍රී ලංකාවේ ආරක්ෂක තත්ත්වය පිළිබඳව අහිතකර වූ ප්‍රචාරණයක් කර තිබීම සංචාරක කර්මාන්තයේ පසුබෑමට විශාල වශයෙන් හේතු විය.

1985 දී සංචාරක පැමිණීම් සංඛ්‍යාව 2,57,456 ක් විය. මෙය 1984 සංචාරක පැමිණීම් ප්‍රමාණයට (3,17,734) වඩා සියයට 19 කින් ද, 1982 සංඛ්‍යාවට වඩා සියයට 37 කින් ද අඩු වේ. නැගෙනහිර ආසියාතික කලාපයේ සංචාරක පැමිණීම්වල සියයට 5 ක පමණ සාමාන්‍ය වැඩි වීමක් හැරුණුවිට අන් සියළුම කලාපවල සංචාරක පැමිණීම් විශාල වශයෙන් අඩු වීමක් දක්නට ලැබේ. ජපානයෙන් පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව 1984 සිට 1985 දක්වා පිළිවෙලින් 20,600 සිට 23,356 දක්වා සියයට 13 කින් වැඩි වීම නැගෙනහිර ආසියාවේ සංචාරක පැමිණීම් වැඩි වීමට හේතු විය. මෙම වැඩිවීම් කලාපයේ අනෙකුත් රටවල සංචාරක පැමිණීම්වල පහත වැටීමෙන් ඇති වන සමස්ත ප්‍රතිඵලය සමනය කිරීමට සමත් විය. ශ්‍රී ලංකාවේ සංචාරක

කර්මාන්තයේ ප්‍රධානතම වෙළඳපොල වන බටහිර යුරෝපයේ සංචාරක පැමිණීම් 1984 සිට 1985 දක්වා පිළිවෙලින් 1,91,070 සිට 1,53,004 දක්වා සියයට 20 කින් පහත වැටුණි. දකුණු ආසියාව (10,358) සහ උතුරු ඇමෙරිකාව (41,052) වැනි අනෙකුත් ප්‍රධානතම කලාපවල සංචාරක පැමිණීම් පිළිවෙලින් සියයට 24 කින් සහ සියයට 31 කින් අඩු විය.

**1 . 31 සංඛ්‍යා සටහන**

**සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යා ලේඛන 1984 – 1985**

| ශීර්ෂය | 1984 | 1983 ට වඩා ප්‍රතිශත වෙනස | 1985 | 1984 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම් | 317,734 | – 5·9 | 257,456 | –18·9 |
| 2. පැය 24 කට අඩු කලකට රට තුළ රැඳෙන විදේශික මගීන්ගේ පැමිණීම් | 8,599 | 19·8 | 9,882 | 14·9 |
| 3. සංචාරක දින (රාත්‍රී) ගණන (දහස්) | 2,819 | –11·3 | 2,369 | –15·9 |
| 4. සංචාරකයින්ගෙන් දළ ලැබීම් | | | | |
| 4·1 රුපියල් දශ ලක්ෂ | 2,737·8 | – 5·5 | 2,239·3(අ) | –18·2 |
| 4·2 එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ | 107·6 | –15·2 | 82·4 | –23·4 |
| 4·3 විගැහි දශ ලක්ෂ | 105·0 | – 8·8 | 81·0 | –22·9 |
| 5. පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින්ගේ ගණන | | | | |
| 5·1 විනෝදය | 300,336 | – 2·1 | 234,038 | –22·0 |
| 5·2 ව්‍යාපාරික කටයුතු | 10,934 | –43·6 | 18,214 | 66·5 |
| 6. කලාප අනුව පැමිණි ගණන | | | | |
| 6·1 බටහිර යුරෝපය | 191,070 | 8·4 | 153,142 | –19·8 |
| 6·2 ආසියාව | 89,736 | –28·0 | 78,666 | –12·3 |
| 6·3 උතුරු ඇමෙරිකාව | 15,020 | 2·3 | 10,922 | –27·2 |
| 7. මුළු සේවා නියුක්තිය | 59,463 | 10·0 | 60,000 (අ) | 0·9 |
| 7·1 සෘජු | 24,595 | 9·9 | 24,840 | 1·0 |
| 7·2 වක්‍ර | 34,868 | 11·6 | 35,160 | 0·8 |

(අ) තාවකාලිකයි.

මූලය : ලංකා සංචාරක මණ්ඩලය.

දිවයින තුළ පැවති අවුල් සහගත වාතාවරණය නිසා, 1980 ගණන්වල මුල් භාගයේදී පැවති ආර්ථිකයේ පසුබෑසීම්වලින් පසු බටහිර යුරෝපීය වෙළෙඳපොල අනුක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමෙන් පසු සංචාරක පැමිණීම්වල සිදු වූ වර්ධනයෙන් ප්‍රතිලාභයක් අත් පත් කර ගැනීමට ශ්‍රී ලංකාව අපොහොසත් වූ බව සංචාරක පැමිණීම් සංඛ්‍යාවෙහි පහත් මට්ටමෙන් පැහැදිලි වේ. මෙම තත්ත්වයට හාත්පසින් වෙනස් ලෙස, පැය 24 කට අඩු කාලයක් දිවයින තුළ ගත කරන තාවකාලික විදේශීය අමුත්තන්ගේ (සංචාරක මගීන්) පැමිණීම් (ගමන් අතරතුර දිවයිනට ගොඩ බසින මගීන් හැර) ප්‍රමාණ 1983 දී 9,882ක් විය. ඉකුත් වර්ෂයට වඩා සියයට 14 ක වැඩි වීමක් මෙයින් දක්වේ.

1985 වර්ෂයේ සංචාරක දින ගණන (සංචාරකයින් විසින් ගත කළ රාත්‍රී ගණන) 23,65,262 ක් වූ අතර මෙය ඉකුත් වර්ෂයේ සංඛ්‍යාවට වඩා සියයට 16 කින් අඩු වීමක් පෙන්විය. ඉකුත් වර්ෂයේදී මෙන්ම සංචාරකයකු දිවයින තුළ ගත කරන සාමාන්‍ය කාල සීමාව මෙම වර්ෂයේදීත් රාත්‍රී 9 ක් විය.

සංචාරක පැමිණීම්වල අඩුවීමක් තිබියදීත් 1985 වර්ෂයේ මුළු පැමිණීම්වලින් සියයට 59 ක් හිමි කර ගත් බටහිර යුරෝපය තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංචාරක වෙළෙඳපොල විය. කෙසේ වෙතත් පසුගිය වර්ෂයේ පැවති මට්ටමට වඩා ප්‍රතිශතක 1 ක සුළු අඩු වීමක් මෙහි දක්නට ඇත. විශාලත්වය අතින් දෙවැනි තැන හිමි කරගත් ආසියාතික වෙළෙඳපොලෙහි පංගුව ඉකුත් වර්ෂයෙහි සියයට 29 ක්ව තිබී, මෙම වර්ෂයේදී සියයට 31 දක්වා වැඩිවිය. නැගෙනහිර ආසියාතික කලාපයේ සංචාරක පැමිණීම් සඛ්‍යාව වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. උතුරු ඇමෙරිකාවේ සහ ඕස්ට්‍රලේෂියාවේ වෙළෙඳපොල පංගු සුළු වශයෙන් පහත වැටුණි.

ලංකා සංචාරක මණ්ඩලයේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව 1985 වර්ෂයේදී සංචාරක කර්මාන්තයේ දළ විදේශීය විනිමය ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 2,239 ක් විය. මෙය, ඉකුත් වර්ෂයේ ඉපැයීම්වලට වඩා සියයට 18 ක අඩු වීමකි. විගැහි වටිනාකම් අනුව මුළු ඉපැයීම් විගැහි දශ ලක්ෂ 81 ක් වූ අතර මෙය සියයට 23 ක අඩු වීමක් පෙන්වීය.

විනෝදාශ්වාදය සඳහා පැමිණි සංචාරකයින්ගේ ප්‍රමාණය මුළු පැමිණීම්වල ප්‍රතිශතයක් වශයෙන් 1984 දී සියයට 95 සිට 1985 දී සියයට 89 දක්වා අඩු වුවද එය සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන අරමුණ ලෙස තවදුරටත් පැවතින. මෙයට ප්‍රතිවිරුද්ධ ලෙස ව්‍යාපාරික අරමුණු සඳහා පැමිණි සංඛ්‍යාව 1984 දී සියයට 3 සිට 1985 දී සියයට 7 දක්වා වැඩි විය.

සංචාරක අංශයේ සේවා නියුක්තිය 60,000 කට ආසන්න ප්‍රමාණයක නොවෙනස්ව පැවතීම සංචාරක කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය පසු බැසීම තවදුරටත් හෙළිකරයි.

ශ්‍රේණිගත නවාතැන් අංශයේ ධාරිතාවය 1984 දී ඒකක 146 සිට 1985 දී ඒකක 143 දක්වා අඩු විය. 1974 සිට 1984 දක්වා සියයට 9 ක අඛණ්ඩ වර්ධනය සමග මෙම අඩු වීම සැසඳිය හැකිය. කෙසේ වෙතත් ශ්‍රේණිගත නවාතැන් අංශයේ මුළු කාමර සංඛ්‍යාව 1984 හා 1985 ඇතුළත 9,627 සිට 9,826 දක්වා වැඩි විය. සංචාරක පැමිණීම් මෙන්ම සංචාරක දින ගණන් ද පහත වැටීම හේතු කොට ගෙන ශ්‍රේණිගත හෝටල්වල සාමාන්‍ය කාමර උපයෝගීකරණය ඉකුත් වර්ෂයේ සියයට 36 සිට මෙම වර්ෂයේ දී සියයට 33 දක්වා අඩු විය. 1984 දී අතිරේක නවාතැන් අංශයෙහි මුළු කාමර සංඛ්‍යාව 1,270 ක්ව තිබී 1985 දී 1,308 දක්වා සුළු වශයෙන් වැඩි විය. ඉකුත් වර්ෂය සමග සසඳන විට සංචාරකයින් කෙටි කාලයක් දිවයින තුළ රැඳීම සහ සංචාරක පැමිණීම් අඩු වීම යන කරුණුවල ප්‍රතිඵලයක් වශයෙන් අතිරේක නවාතැන් අංශයේ කාමර උපයෝගීකරණය පහත් අඩියකට පත් විය.

ප්‍රාදේශික වශයෙන් ශ්‍රේණිගත නවාතැන් අංශයෙහි කාමර උපයෝගීකරණය සළකා බැලීමේදී කොළඹ නගරයෙහි සියයට 38 ක සහ මහ කොළඹ සියයට 35 ක කාමර උපයෝගීකරණ අනුපාත දක්නට ලැබේ. මෙම ප්‍රතිශත අගය 1984 වර්ෂයේ අදාළ ප්‍රතිශතක හා සසඳන විට පිළිවෙලින් ප්‍රතිශතක 7 ක සහ ප්‍රතිශතක 3 ක අඩු වීම් පෙන්නුම් කරන ලදී. දකුණු වෙරළ බඩ ප්‍රදේශයෙහි ඉකුත් වර්ෂයේදී මෙන්ම කාමර උපයෝගීකරණය සියයට 34 ක් විය. මේ අතර කඳුරට සහ පෞරාණික නගරවල කාමර උපයෝගීකරණය 1984 දී පිළිවෙලින් සියයට 32 ක් සහ සියයට 31 ක් ද වශයෙන් තිබී 1985 දී පිළිවෙලින් සියයට 28 ක් සහ සියයට 27 ක් ද දක්වා විශාල අඩු වීමක් වාර්තා විය.